**ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 04 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් ආදයම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම, දෙපාර්තමේන්තු පොත් අනුව රු.27,882,779 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ එය රු.45,791,580 ක් වශයෙන් රු.17,908,801 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනත් ආදායම් ශීර්ෂවල ආදායමෙන් වෙනත් වැය ශීර්ෂවල ආදායම අඩු කිරීමෙන් පසු ශුද්ධ ආදායම ගැන විමසීමක් කර නොමැති බැවින්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මෙසේ සඳහන් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය දෙපාර්තමේන්තු පොත් අනුව සකස් කළ යුතුයි. |

**(ආ) පුනරාවර්තන වියදම් හා මූලධන වියදම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම දෙපාර්තමේන්තු පොත් අනුව රු.134,768 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.18,043,570 ක් වශයෙන් රු.17,908,802 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රු.134,768 ක ශේෂය විශ්‍රාමික නිලධාරියෙක්ගෙන් අයවිය යුතු ආපදා ණය, පාපැදි ණය හා වැඩිපුර ගෙවීම් කරන ලද මුදල විශ්‍රාමික පාරිතෝෂිකයෙන් මාරු පත්‍ර යොදා අය කර ගැනීම වේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය දෙපාර්තමේන්තු පොත් අනුව සකස් කළ යුතුයි. |
| (ii) | දෙපාර්තමේන්තු පොත් අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.535,661,619 ක් හා මූලධන වියදම් රු.143,682,697 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පිළිවෙලින් රු.532,181,969 ක් හා රු.147,162,347 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් රු.3,479,650 ක් බැගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය අඩුවෙන් හා | රු.3,479,650 ක මුදල වැඩිපුර ගෙවන ලද වැටුප් නැවත අයකර ගැනීම්, වැඩ තහනම් කිරීම හේතුවෙන් එම කාලසීමාවට අදාළ ගෙවන ලද වැටුප් නැවත අයකර ගන්නා ලද මුදල් වේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය දෙපාර්තමේන්තු පොත් අනුව සකස් කළ යුතුයි. |

ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද | 2,568,817 | මියගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.478,872 ක්, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.724,136 ක් හා වැඩ තහනම් කර ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.1,365,809 ක් වශයෙන් එකතුව රු. 2,568,817 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එයින් රු.1,077,431 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂ විය. | මියගිය නිලධාරීන්ගේ උරුමකරුවන්ට හිඟ ණය ශේෂ පිළිබඳ දැනුම්දීම කෙතරම් සිදුකළද ප්‍රතිචාර නොදක්වයි. වර්ෂ 05 කට වැඩි ණය ශේෂ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදුකරන බව දන්වමි. | හිඟ හිටි ණය ශේෂ හඳුනාගෙන ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 ඡේදය ප්‍රකාරව කටයුතු කර කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් වුවද, පහත සඳහන් කරුණු අනුව එම අරමුණ නිසි ආකාරයට ඉටු වී නොමැති බවට නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවට ආවේණික සහ වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීමේ අරමුණින් ආරම්භ කර ඇති පින්නවල සත්වෝද්‍යානයේ දැනට සිටින සත්ත්ව විශේෂ 26 තුළ ශ්‍රී | වලස් අරණ තුළ සිටින පිරිමි වලසාට සුදුසු ගැහැණු වලසුන් ලබාගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇති නමුත් අධිකරණය මඟින් ලබා දුන් නඩු තීන්දුවක් | සත්වෝද්‍යාන ආරම්භ කිරීමේ අරමුණු ඉටු වන පරිදි කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ 03 කට අයත් සතුන් 10 දෙනෙකු පමණක් සිටින අතර ඒ තුළ සිටි ගැහැණු හා පිරිමි වලසුන් දෙදෙනා සහ ශ්‍රී ලංකානු දිවියන් 05 දෙනා අතර පවතින වයස් භේදයන් සහ නොගැලපීම් හේතුවෙන් පැටවුන් බිහි වී නොතිබුණි. | හේතුවෙන් සුදුසු වයස් සීමාවේ පසුවන වලසුන් වනයෙන් ලබාගැනීමට නොහැකි වී ඇත. සත්ව අභිජනනය සඳහා සුදුසු වයසේ දිවියන් පින්නවල සත්වෝද්‍යානය තුළ සිටියද ඔවුන් ස්වාභාවිකව අභිජනනය මගින් පැටවුන් බිහිවීම සිදු නොකිරීම නිසා කෘතිම සංසේචනය මගින් දිවියන් බෝකර ගැනීම සඳහා වැඩසටහනක් ආරම්භ කර ඇත. | |
| (ආ) | අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම පින්නවල සත්වෝද්‍යානය ඇති කිරීමේ එක් අරමුණක් ලෙස දක්වා තිබුණද, එම සත්වෝද්‍යානය තුළ පර්යේෂණ මධ්‍යස්ථානයක් ඉදි කර පර්යේෂණ කාර්යයන් සිදු කරන බවට නිරීක්ෂණය නොවීය. | මේ වනවිට දිවියන් ස්වාභාවිකව බිහිවීම සිදුනොවීම නිසා කෘතිම සංසේචනය මගින් සතුන් බෝකර ගැනීම සඳහා පර්යේෂණයක් ආරම්භ කර ඇත. | සත්වෝද්‍යාන ආරම්භ කිරීමේ අරමුණ ඉටු වන පරිදි කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුව සතු එකම සෆාරි උද්‍යානය වූ රිදියගම සෆාරි උද්‍යානය ආරම්භ කර වසර 08 ක් පමණ ගත වී තිබුණ ද, එම උද්‍යානය ක්‍රියාත්මක කිරීමට අදාළව නිශ්චිත මාර්ගෝපදේශයක් පිළියෙල කර නොතිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා වන මූලික කටයුතු සිදුකරන ලද අතර, එහි ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා වාර 02 ක් අවසන් කර ඇත. | උද්‍යානය ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශයක් කඩිනමින් සකස් කර ගත යුතුය. |
| (ඈ) | සෆාරි උද්‍යානයේ 2023 දෙසැම්බර් 31 දිනැති තක්සේරු වාර්තාව අනුව එහි සිටින විශේෂ 60 කට අයත් සතුන් 1,247 ක් අතරින් සතුන් 112 කගේ ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගෙන නොතිබීම, සතුන් 529 දෙනෙකු තාරකා ඉබ්බන් වීම යන කරුණු අනුව විශාල, වර්ණවත් හා ආකර්ෂණීය බවින් යුතු සතුන් ප්‍රමාණවත්ව නොසිටීමත්, ආකර්ෂණීය පරිසරයක් සහ නිසි ප්‍රචාරණයක් නොතිබීමත් සංචාරකයන්ගේ පැමිණීම අඩුවීම කෙරෙහි බලපා තිබුණි. | ස්ත්‍රී පුරුෂභාවය බාහිරින් හඳුනාගත නොහැකි වූ පක්ෂීන් සම්බන්ධයෙන් අදාළ විෂයය පිළිබඳව දැනුමක් ඇති අයෙකු යොදවා එම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. 2019 වසරේ සිට 2022 වසර දක්වා සතුන් ආනයනය නවතා තිබූ අතර 2023 වසරේ එම කටයුතු යලි ආරම්භ කරන ලද බැවින්, මේ වනවිට ලැබී ඇති සතුන් දෙහිවල සත්වෝද්‍යානයේ නිරෝධායනය කිරීම අරඹා ඇත. | සත්වෝද්‍යානය තුළ ආකර්ශණීය සතුන් වැඩි කර ගනිමින් ආකර්ශණීය පරිසරයක් ඇති කර පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙහිවල සත්වෝද්‍යානයේ රු.මිලියන 11 ක ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර නිම කිරීමට සැලසුම් කර තිබුණු කාර්යයන් 04 ක් ඉටු කර නොතිබුණි. | නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන මධ්‍යම රජයෙන් නොලැබුණු බැවින්, අත්‍යවශ්‍ය කාර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදුන් බව දන්වා තිබුණි. | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, බැහැරවීම් වලදී සැලසුම් සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | විනෝදාස්වාද මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම සහ සංචාරක ව්‍යාපාරය දිරිමත් කිරීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා පින්නවල සත්වෝද්‍යානය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණු කලාප 11 ක් අතරින් සංචාරකයින්ගේ ආකර්ෂණය වැඩි කර ගැනීම සඳහා ඉතා වැදගත් අංග වන මීන් මැදුර සහ කුඩා ළමුන් සඳහා වූ ජල ක්‍රීඩා උද්‍යානය ඉදිකිරීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | පවතින ආර්ථික අර්බුද නිසා ලැබෙන ප්‍රතිපාදන සීමා වී ඇති බැවින්, රජය මඟින් ලබාදෙනු ලබන ප්‍රතිපාදන අනුව ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන අතර මීන්මැදුරක් ඉදිකිරීමට හා නඩත්තු කිරීම සඳහා ඉතා අධික පිරිවැයක් දැරීමට සිදුවන බව දන්වා සිටිමි. | සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පින්නවල අලි අනාථාගාරයේ මෝදරවත්ත ඉඩමෙහි වැට සකස් කිරීම සහ ප්‍රවේශ මාර්ගය සකස් කිරීම සඳහා රු.මිලියන 2.5 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 20 ක් වී තිබුණි. | ව්‍යාපෘතියට අදාළ ඇස්තමේන්තු සකස්කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ අවශ්‍ය ගොඩනැඟිලි ද්‍රව්‍ය පින්නවල අලි අනාථාගාරයේ ප්‍රධාන ගබඩාව හරහා ඉදිකිරීම් භූමියට ලැබී තිබුණු අතර මෙම මිලදී ගැනීම් වෙනුවෙන් බිල්පත් පියවීම 2024 වර්ෂයේ මුල් කාර්තුවේදී සිදුකර තිබුණි. | වෙන්කර ඇති ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව භාවිත කර සැලසුම්කල කාලය තුල ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ එකතුව රු.176,281,496 ක ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා එළැඹ තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය පරිදි එම ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත්තු අවසන් කර (Terminate) තිබුණ ද, ව්‍යාපෘති නැවත නව කොන්ත්‍රාත්කරුවකුට ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රු.69,558,270 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ වැඩ මූලික අත්තිකාරම් මුදලෙන් රඳවා ගැනීම් මුදල් ගැලපීමෙන් පසු රු.14,360,310 ක මුදලක් තව දුරටත් අය කර ගත යුතුව තිබුණි. | අදහස් දක්වා නොමැත. | අතරමඟ නවතා ඇති මෙම ඉදිකිරීම් වෙනත් ක්‍රමයක් මඟින් සම්පූර්ණ කර ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.215,891,993 ක් වැය කර 2018 සහ 2019 වර්ෂවලදී සම්පූර්ණයෙන් නිමකර තිබූ රිදියගම සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් 10 කින් 06 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙහි පිහිටි විකුණුම් මධ්‍යස්ථාන සඳහා මිල ගණන් කැඳවූව ද කිසිවකු හෝ මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි. 2023 වර්ෂයේ ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය නඩත්තු ව්‍යාපෘති සඳහා පමණක් යෙදවූ බැවින් එම කලාපයට අයත් අනෙකුත් ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට නොහැකි වූ බැවින් මෙම ඉදිකිරීම්ද ඵලදායීව උපයෝජනය කිරීමට නොහැකි විය. | මෙම වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අක්කර 500 ක පමණ වපසරියකින් යුතු රිදියගම සෆාරි උද්‍යානයේ අක්කර 150 ක භූමි ප්‍රමාණයක් ආරම්භයේ සිටම උද්‍යානය සඳහා භාවිතයට ගෙන නොතිබුණි. | 2020-2022 කාල වකවානුවේදී ප්‍රතිපාදන නොලැබීම මත ඉදිකිරීම් ප්‍රමාද වූ අතර, මේ වනවිට සැලසුමට අනුව ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. | උද්‍යානයේ භූමි ප්‍රදේශය ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඇ) | පින්නවල සත්වෝද්‍යානය තුළ සංචාරකයින්ගේ ගමන් පහසුව සැලසීම සඳහා 2017 හා 2020 වර්ෂයන්හි රු.5,449,764 ක වියදමකින් මිලදී ගෙන තිබුණු BUGGY රථ 10 න් 07 ක්ම 2024 මැයි 22 දින වන විටත් අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | පින්නවල සත්වෝද්‍යානයේ බගී රථ 03 ක් අලුත්වැඩියා කර සංචාරකයන්ගේ ගමන් පහසුව සඳහා යොදවා ඇති අතර ඉතිරි රථ අලුත්වැඩියා කිරීමට අදාළව ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. | බගී රථ අළුත්වැඩියා කර ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පින්නවල අලි අනාථාගාරයේ අලි ගාල් පවිත්‍ර කිරීමෙන් ඉවත් කරන අප ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරය 2020 ඔක්තෝම්බර් 31 දින සිට අක්‍රියව පැවතීම හේතුවෙන් 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23(අ) සහ 23(ආ) වගන්ති අනුව පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව පිරිපහදු නොකළ අපිරිසිදු ජලය දිනපතා මා ඔය වෙත මුදා හරිමින් පැවතුණි. | කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සේවක පැමිණීම අවම වූ බැවින් අපජලය පිරිපහදු ඒකකය නිසිපරිදි නඩත්තු නොවූ අතර, ඉදිකිරීම් වල පැවති දුර්වලතා හේතුවෙන් පිරිපහදු ඒකකය ක්‍රියාවිරහිත තත්ත්වයට පත්විය. මේ වනවිට අදියර 03 ක් යටතේ මෙම පද්ධතිය යථාතත්වයට පත්කිරීමට සැලසුම් කර ඇති අතර, මෙම ඒකකය 2024 වර්ෂයේ තුන්වන කාර්තුව අවසන්වීමට පෙර නිමකිරීමට සැලසුම් කර ඇත. | ජලය පිරිපහදු කිරීමේ යන්ත්‍රාගාරය යථා තත්වයට පත්කර පරිසර දූෂණය අවම වන පරිදි අප ද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රිදියගම සෆාරි උද්‍යානය තුළ සංචාරකයින් ප්‍රවාහනයට භාවිතා කරනු ලබන බස් රථයක් සඳහා ඉන්ධන ලීටර් 01 කින් කිලෝමීටර් 4.2 ක් ධාවනය කළ හැකි බව තහවුරු වුවද, ඉන්ධන තුලනය කිරීමේදී 2023 පෙබරවාරි දක්වා ලීටරයකට කිලෝමීටර් 1.16 ක් ලෙසද 2023 මාර්තු සිට කි.මී. 2.1 ක් ලෙසද තුලනය කර තිබීමෙන් ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා බස් රථ 03 ක් සඳහා ඉන්ධන පිරිවැය රු.7,063,875 ක් වී තිබූ අතර එහි නිවැරදි පිරිවැය ආසන්න වශයෙන් රු.3,289,613 ක් වීමෙන් රු.3,774,262 ක් වැඩිපුර වියදමක් දරා තිබුණි. තවද, එම බස් රථ 03 හි 2023 ජූලි සිට ඔක්තෝම්බර් දක්වා ධාවන සටහන්වල දක්වා තිබූ දුර සහ ආරක්ෂක අංශයේ වාර්තා අනුව දුර අතර කිලෝමීටර් 2,190 ක වෙනසක් විය. | උද්‍යානය තුළ සතුන් ගැවසීම නිසා රථවාහන ධාවනය කරන වේගය පැයට කිලෝමීටර් 10 – 15 දක්වා සීමා කර ඇත. මේ නිසා උද්‍යානය තුළ වැඩි ඉන්ධන පරිභෝජනයක් සහිත 01 හා 02 ගියර්වල පමණක් වාහන ධාවනය සිදුකරයි. ඒ අනුව, ඉන්ධන තුලනය කිරීමේදී සෆාරි උද්‍යානයේ අභ්‍යන්තර 1,2 ගියරවල කිලෝ මීටර් 70 - 80 ප්‍රමාණයක් හා ප්‍රධාන මාර්ගයේ 3,4 ගියරවල කිලෝමීටර් 20 ක් දුර ධාවනය කරයි. ඒ අනුව ලද ප්‍රතිඵල හා ඉන්ධන ලබාගැනීම් වාර 02 ක් අතර ධාවනය කරනු ලබන දුර ප්‍රමාණය සලකා ලීටරයට 2.1 km ක් ලෙස ඉන්ධන දහනය තුලනය කරනු ලැබීය.<br><br>එසේම විගණනය විසින් දැනුම් දුන් පරිදි ඉන්ධන පරීක්ෂාවන් නැවත සිදු කරන ලද අතර එය NC 8255 සහ NC 8256 සඳහා ලීටරයකට කිලෝමීටර් 2.3 ක්ද NC 8256 සඳහා ලීටරයකට කිලෝමීටර් 2 ක්ද විය.<br><br>ආරක්ෂක අංශයේ නිලධාරීන්ගෙන් ලේඛන සටහන් කිරීමේ දී අතපසුවීම් සිදුවිය හැකි අතර, ධාවන සටහන්වල නිවැරදිව සටහන් කර ඇත. | ඉන්ධන තුලනය කිරීම නිවැරදිව සිදු කරමින් වාහන සඳහා ඉන්ධන භාවිතය කාර්යක්ෂමව සිදු කළ යුතු අතර වාහන පාලනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය තුළ දෙහිවල සත්වොද්‍යානය නැරඹීම සඳහා 1,288,749 ක් ද, පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා 567,426 ක් ද වශයෙන් ප්‍රමාණවත් දෙස් විදෙස් සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණ තිබිය දී ලංකාවේ එකම සෆාරි උද්‍යානය වූ රිදියගම සෆාරි උද්‍යානය හා ලංකාවේ එකම එළමහන් සත්වොද්‍යානය වූ පින්නවල සත්වොද්‍යානය සඳහා පැමිණ තිබූ සංචාරකයින් සංඛ්‍යාව පිළිවෙලින් 227,076 ක් හා 277,865 ක් විය. ප්‍රමාණවත් හා විවිධත්වයෙන් යුතු සතුන් සංඛ්‍යාවක්, ආකර්ෂණීය පරිසරයක් සහ නිසි ප්‍රචාරණයක් නොතිබීම ඒ සඳහා හේතු වී තිබුණි. | 2019 සිට 2022 දක්වා රට තුළ පැවති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් හා ආනයන සීමා හේතුවෙන් නව සතුන් ආනයනය කිරීමට නොහැකි වූ අතර 2023 වසරේ සත්ව හුවමාරු කටයුතු නැවත ඇරඹුණු අතර දේශීය වශයෙන් කළු හංසයින් හා බැටළුවන් 2024 වසරේදී සෆාරි උද්‍යානයට ලබාගන්නා ලදී. තවද, විදේශීය සත්ව හුවමාරුව යටතේ රුසියාව හා ඉන්දියාව යන රටවලින් සතුන් ලබාගැනීම මේ වනවිට ආරම්භ කර ඇත. | සංචාරක ආකර්ෂණය වර්ධනය වන ආකාරයට පින්නවල සත්වෝද්‍යානය සහ රිදියගම සෆාරි උද්‍යානය සකස් කළ යුතුය. |
| (ආ) | රිදියගම සෆාරි උද්‍යානයේ 2023 වර්ෂයේ ජුනි 02 දින සිදු කළ බෙංගාලි ව්‍යාඝ්‍රයාගේ මරණ පරීක්ෂණ වාර්තාව අනුව එම ව්‍යාඝ්‍රයා විෂ ශරීර ගත වීමෙන් මරණයට පත්වී තිබුණු අතර සෆාරි උද්‍යානයේ රැකවරණයේ සිටින සතෙකු ස්වභාවික නොවන මරණයකට ගොදුරු වීම සම්බන්ධයෙන් විමර්ෂණ කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි. | බෙංගාල ව්‍යාඝ්‍රයාගේ මරණය සම්බන්ධව 2023 වසරේ විමර්ශන කමිටුවක් පත්කළ අතර එම සත්වයාගේ පටක සාම්පල පිළිබඳව රස පරීක්ෂක වාර්තා මෙතෙක් නොලැබීම මත පරීක්ෂණයේ අවසන් වාර්තාව ප්‍රමාද වී ඇත. | කඩිනමින් විමර්ශන කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට 896 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 175 ක් පුරප්පාඩු වී පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 38 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 126 ක් ඇතුළත් විය. | පශු වෛද්‍යවරුන් තිදෙනෙකු බඳවා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය හරහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලිපි යවා ඇති අතර විද්‍යාත්මක සේවයේ නිලධාරීන් තිදෙනෙකු බඳවා ගැනීම සඳහා ලිපි යොමු කර ඇත.<br><br>ද්විතීක මට්ටමේ පුරප්පාඩු පිරවීම සඳහා ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | රිදියගම සෆාරි උද්‍යානයේ සතුන්ගේ ප්‍රතිකාර කටයුතු සඳහා අනුමත කාර්ය මණ්ඩල ලැයිස්තුවේ පශු වෛද්‍යවරුන් තිදෙනෙකු අවශ්‍ය බවට දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එක් පශු වෛද්‍යවරියක පමණක් සේවයේ නිරතව තිබුණි. | කොන්ත්‍රාත් පදනම මත පශු වෛද්‍යවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇත. | පුරප්පාඩු පුරවා දෙපාර්තමේන්තුවේ කටයුතු මනා අයුරින් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය |